# ජනාධිපතිවරණය හා ජනතාව

අද නැවත වරක් අධිරාජ්‍යගැති පාලක පංතිය ජනාධිපතිවරණයක් සඳහා ජනතාව පෙළ ගස්වමින් සිටියි. විධායක ජනාධිපති ක්‍රමය වේවා, පැවැතුණු අගමැති ක්‍රමය වේවා පවත්වා ගෙන යනු ලබන්නේ අධිරාජ්‍යවාදී ක්‍රමය විසිනි. නඩත්තු කරන්නේ අධිරාජ්‍යවාදී ක්‍රමය විසිනි. අධිරාජ්‍යවාදී ක්‍රමය යනු මුලු මහත් ලෝක ජනතාවත්, ස්වාභාවික සම්පත් සියල්ලමත් අතලොස්සක්වූ ධනපතියන් විසින් මෙහෙයවනු ලබන සමාජ ක්‍රමයකි. මුලු මහත් ලෝකයම ආර්ථික, දේශපාලනමය, සහ සංස්කෘතික වශයෙන් එකට ගැට ගැසුණු ක්‍රමයකි.

ධනපතියන් මෙම ක්‍රමය පවත්වා ගෙන යනු ලැබීම සඳහා අනිවාර්යයෙන්ම ජනතාව රැවටිය යුතුය. ධනපති කණ්ඩායම් වටා ජනතාව බෙදා තැබිය යුතුය. මේ සඳහා මැතිවරණ පැවැත්වීමද හොඳ ක්‍රමයකි. ජනතාව ඊළඟ වසර කිහිපය සඳහා තමන්ගේ පීඩකයා තේරීමේ ක්‍රමයකි. ජනතාවට දෙනු ලබන්නේ පොරොන්දු පත්‍රයකි. දෙනු ලැබූ කඩවුණු පොරොන්දු කොපමණද? ''මව්බිම සුරකිමු'' ''මට පෙර රට'' යන, මෙම මැතිවරණයේදී ප්‍රධාන ධනපති අපේක්ෂකයන් දෙදෙනාගේම සටන් පාඨවල හරය එකකි. දෙදෙනාම නියෝජනය කරනු ලබන්නේ මෙම ක්‍රමයයි. දෙදෙනාම උතුරේ දෙමළ ජනතාව සංහාරය කිරීමේ හා අනාථ කිරීමේ වීරයින් ලෙස පෙනී සිටිති. ප්‍රජාතන්ත්‍රවාදය සඳහා පෙනී සිටිති.

ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදය තිබේද? නැත. ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදය ලැබේද? නැත. ජනතාව ප්‍රජාතන්ත්‍රවාදය දිනාගත යුතුය. ඒ කුමන ප්‍රජාතන්ත්‍රවාදයද? නිර්ධන පංති ප්‍රජාතන්ත්‍රවාදයයි. නිර්ධන පංති ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කරනු ලබන්නේ කම්කරු පංතියයි. **මෙම ක්‍රමයේ සියලුම නිෂ්පාදනයන් බිහි කරනු ලබන නමුත් ඒ කිසිවක අයිතියක් නැති, නැතිවීමට යදම් ඇති, දිනාගන්නට ලෝකයක් ඇති කම්කරු පංතියට** පමණි.

කම්කරු පංතියට, ගොවි ජනතාවට සමාජයේ අනිකුත් පීඩිත කොටස්වලට දර්ශනයක් තිබේද? ලෝකය පුරා ඇත්තේ දර්ශනයන් දෙකකි. නිර්ධන පංති ජාත්‍යන්තරවාදය හා ධනේෂ්වර පංති මතවාදයයි. මෙම දර්ශනයන් දෙකම ලෝක පරිමාණයෙන්, මෙම සමාජ ක්‍රමය පටන් ගත් දා සිට අවසානය දක්වාම ගැටෙයි. ලෝකය පාලනය කරනු ලබන්නේ ලෝක ධනපතියන් නිසා සියලුම ධනේෂ්වර මාධ්‍ය ආයතන, සන්නිවේදන ආයතන එම මතවාදය ලොව පුරා ගෙන යනු ලබයි. එනිසා කම්කරු පංතිය තුළත් ගොවි ජනතාව තුළත් අනිකුත් පීඩිත කොටස්වලත් ඇත්තේ ධනේෂ්වර මතවාදයයි. ධනේෂ්වර පංති මතවාදය ජනතාවට වැරැහැලි අන්දවයි. සිඟාකෑම උරුම කරයි. දීනත්වයට පත් කරයි. වැඩ කරන ජනතාවට ශ්‍රමය තව දුරටත් ධනපතියන්ට විකිණිය නොහැකි විට ඒ අයව ඉවත්කර ඒ වෙනුවට තරුණ ශ්‍රමය ආදේශ කරයි.

සමාජ ප්‍රජාතන්ත්‍රවාදය දේශනා කරනු ලබන ජනතා දේහීන්ද මේවා සාධාරණය කිරීමට ඉදිරිපත්ව සිටී. ධනපති ආයතනවල වෙළඳ සහායිකාවන් ලෙස තරුණියකගේ ශ්‍රමය මසකට රුපියල් හාරදහසකට විකිණෙන බව පාලක පංතීන් නොදන්නේද? මසකට රුපියල් ලක්ෂයකට වැඩි වැටුප් ලබන රාජ්‍ය හා පෞද්ගලික සමාගම්වල නිලධාරීන් ගේ හා මසකට රුපියල් හාර දහසක් ලබන තරුණ ජීවිත සමාන වේද? අපූරු ප්‍රජාතන්ත්‍රවාදයකි. රුපියල් දස දහස් ගණනින් මාසික වැටුප් ලබන ගොවි නිලධාරීන් හා නියඟයෙන් හා ගං වතුරෙන් නිරන්තරයෙන් පීඩා විඳින, අස්වනු නෙළන කාලයට ඔවුන්ගේ නිෂ්පාදන වල මිල පහත යන, අනිකුත් කාලයට මිල ඉහල යන අන්ත අසරණ ගොවි ජනතාවගේ ජීවිත හා සංසන්දනය කර බලන්න. අපූරු ප්‍රජාතන්ත්‍රවාදයක් නේද? සියලුම සමාජ අසමානතාවයන් ඉවත් නොකරනතාක් සැබෑ ප්‍රජාතන්ත්‍රවාදයක් තිබිය නොහැක. සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය දිනාදිය හැක්කේ කම්කරු පංතියට පමණි. කම්කරු පංතියේ ඓතිහාසික කාර්‍යභාරය එයවෙයි. සියලුම වරප්‍රසාදයන් අහෝසිකර දමන්නේ නම් පමණක් සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය උදාවෙයි.

සැබෑ ප්‍රජාතන්ත්‍රවාදයට විරුද්ධ වන්නේ කවරෙක්ද? කම්කරු පංතියේ ඓතිහාසික ක්‍රියා මාර්ගයෙන් කම්කරු පංතිය ඉවතට තල්ලු කර දමන දුෂ්ඨ බල වේගයන්ය. තමන් දේශප්‍රේමියකුයයි හඳුන්වාගනු ලබන බලවේග කරන්නේ කුමක්ද? අධිරාජ්‍යවාදී බලවේගයන්ගෙන් යැපෙමින් ජනතාවට මායාව පැතිරීම නොවේද? ජනතාවට සහන මළු දෙන නායකයන් පවසන්නේ සදාකාලිකවම පංති විෂමතාවය පවත්වාගෙන යාම නොවේද? ජනතාවගේ දුක වේදනාවන් ප්‍රතිමාවකට හෝ ගසකට පැවසීමට යොමු කරන්නෝ නොමැතිද? නැති නම් උපදින වේලාව අනුව ජීවිතයේ යහපත හා අයහපත ඇතිවන බව පැවසීම නොවේද? මේ සියලුම අය සැබෑ ප්‍රජාතන්ත්‍රවාදයට විරුද්ධ වෙති. අද ලෝකය මානව ඉතිහාසයේ ගැඹුරුම අර්බුදය කරා ගමන් කරමින් සිටියි. ඉහළම විසඳුම කරා ගමන් කරමින් සිටියි. එය සකස් කරනු ලබන්නේ මිනිසකුගේ මනෝමූල කල්පනාවන් තුළ නොව විෂයමූල ලෝකයේ නීතීන් මගිනි.

සෑම ක්‍රියාවකටම සමානවූද, ප්‍රතිවිරුද්ධවූද ක්‍රියාවක් ඇත. මෙය ධනේෂ්වර සමාජ ක්‍රමය ආරම්භයේදීම ස්වාභාවික විද්‍යාඥයෙකු වූ අයිසැක් නිව්ටන් විසින් ස්වභාවයේ තිබූ මෙම නීතිය අනාවරණය කෙරිණි. ඒ නීතියට අනුව ක්‍රියා කිරීමෙන් අද මානවයා ග්‍රහලෝක තරණය කිරීමේ යෙදී සිටියි. නමුත් මිහිතලය මත ඒ මානවයාගේම විශාල බහුතරයක් දිනපතා නිරාහාරව ද, බීමට පිරිසිදු ජලය ද, හිසට වහලක් ද නැතිව, මුඩුක්කු නිවාසවල කිසිදු අධ්‍යාපනයක් නැතිව ජීවත් වීමට සිදුව ඇත. එමෙන්ම දිනපතා වසංගත රෝගවලින් මිය යන පිරිස කොපමණද? **මෙම තත්ත්වය ඇති කරනු ලබන්නේ මෙම ක්‍රමය මගිනි**. මෙම තත්ත්වයන් අහෝසි කරන්නට යමෙක් කල්පනා කරන්නේ නම් මෙම සමාජ ක්‍රමයේ නීතීන් ඉදිරිපත් කර ක්‍රියා කළ අයගේ දර්ශනයන් ග්‍රහණය කරගත යුතුය. ඒ අන් කිසිවක් නොව මාක්ස් ඉදිරිපත් කරනු ලැබූ ලෙනින් විසින් ක්‍රියාවට නගා පෙන්වූ මාඕ විසින් ඉදිරියට ගෙන ගියා වූ

ශ්‍රේෂ්ඨ නිර්ධන පංති නායකයින් ඉදිරිපත් කරන ලැබූ ජාත්‍යන්තර නිර්ධන පංති මත වාදය වූ මාක්ස්වාදයයි. මාක්ස්-ලෙනින්-මාඕ වාදය ග්‍රහණය කරනු ලබන්නෝ කවරෙක්ද, ඔවුහු සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පෙනී සිටිති.

මෙම අවස්ථාවේ කළ යුත්තේ කුමක්ද? ජනතාව අනාථ කඳවුරු වල ජීවත් වෙති. දිනපතා නියමාකාර බෙහෙත් නොමැති වසංගත රෝගවලින් ජනතාව මරණයට පත් වෙති. නියඟයෙන් ගං වතුරෙන් ජනතාව පීඩා විඳිති. දිනෙන් දින ඉහළ යන බඩු මිළ ඉදිරියේ ජනතාව සාගින්නේ පසුවෙති. ඒවා විසඳනු වෙනුවට කෝටි ගණන් මහජන මුදල් වැය කරමින් පාලක පංතිය ප්‍රෝඩාකාරී මැතිවරණ පවත්වයි. ජනතාව අසමගියට පත් කරයි. මෙම ප්‍රෝඩාකාරී මැතිවරණ වලින් ඉවත් වී ලෝකයේ විවිධ රටවල ජනතාව මුහුණ දෙන ප්‍රශ්න විමසා බැලිය යුතුය. ඉරාකයේ ජනතාවට අත් වූ ඉරණම කුමක්ද? ඇෆ්ගනිස්ථානයේ සිදු කරන්නේ කුමක්ද? ඉරානයට සිදු කිරීමට යන්නේ කුමක්ද? සිදු වූයේ කුමක්ද? නේපාලයේ සිදුවූයේ කුමක්ද? අසල්වැසි ඉන්දියාවේ සිදුවන්නේ කුමක්ද? මෙම ප්‍රශ්න දෙස ජනතාවගේ ඇස් නොහැරෙන තාක්කල් ජනතාවට අන්ධභාවයෙන් මිදිය නොහැකිය. ජනතාව රවටන, බේද කරන, මෙම මංකොල්ලකාරී ප්‍රෝඩාකාරී මැතිවරණ වලින් ඉවත් වී, අතීතයේ සියලුම ක්‍රියාදාමයන් අවබෝධ කරගත හැකි, අනාගතයේ සිදුවන දෙය දැකිය හැකි, ඒ අනුව මර්තමානයේ කළ යුතු දෙය කළහැකි මිනිසෙක් වීමට, මාක්ස්වාදය ලෙනින්වාදය මාඕවාදය අවබෝධ කරගැනීම සඳහා පෙළ ගැසෙන ලෙස ආයාචනා කරමු...!

නව මාක්ස්වාදී අධ්‍යයන කණ්ඩායම
2009 දෙසැම්බර්
P -01

http://slmarxist.yolasite.com
slmarxist@ymail.com